# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Sabaragamuwa Provincial Department of Educition

අනාවරණ පරීක්ෂණය - 2021
Diaganostic Test

11 ශ්‍රේණිය
Grade 11

බුද්ධ ධර්මය I
Buddhism I

පැය එකයි
One hour

නම/ විභාග අංකය :- ........................................................................................................

- **සියලු ම** ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ** පිළිතරට අදාළ වරණය තෝරන්න.

---

01. බෝසතාණන් වහන්සේ තම අවසන් උපත සඳහා සුදුසු පසුබිම නුවනින් විමසා බැලීම හඳුන්වන්නේ,

i. පංච සතිකා නමිනි. ii. පංච මහා විලෝකන නමිනි.

iii. පංච අභිඥා නමිනි. iv. පංච බල නමිනි.

02. දරුණු නාලාගිරි දමනය වූයේ බුදුරජාණන් වහන්සේ තුළ පැවති,

i. තාදී ගුණය නිසාය. ii. කරුණා ගුණය නිසාය.

iii. මෛත්‍රී ගුණය නිසාය. iv. පුරිසධම්ම සාරතී ගුණය නිසාය.

03. චුල්ලකම්ම විභංග සූත්‍රයට අනුව ද්වේශයෙන් තොරව කටයුතු කරන්නා,

i. නිරෝගී වෙයි. ii. රූමත් වෙයි.

iii. උසස් කුලවල උපදියි. iv. ප්‍රඥාවන්ත වෙයි.

04. බුදුරජාණන් වහන්සේ සිතීමේ හා විමසීමේ නිදහස අගය කල බව දැක්වෙන සූත්‍රයක් වන්නේ,

i. මංගල සූත්‍රය යි. ii. සෝණදණ්ඩ සූත්‍රය යි.

iii. කාලාම සූත්‍රය යි. iv. පරාභව සූත්‍රය යි.

05. සත්ත බොජ්ඣංග ධර්ම දේශනාව අසා නිරෝගී බව ලැබුවේ,

i. අනුරුද්ධ මහරහතන් වහන්සේය. ii. මුගලන් මහරහතන් වහන්සේය.

iii. ආනන්ද මහරහතන් වහන්සේය. iv. උපාලි මහරහතන් වහන්සේය.

06. අධිෂ්ඨාන පාරමිතාවට අදාළ ජාතක කතාව වන්නේ,

i. මහා කපි ජාතකය යි. ii. මඛාදේව ජාතකය යි.

iii. මඝ මානවක ජාතකය යි. iv. තේමිය ජාතකය යි.

07. සියලු කෙළෙස් දුරුකළ හෙයින් බුදුරජාණන් වහන්සේ,

i. සම්මා සම්බුද්ධ නම් වේ. ii. අරහං නම් වේ.

iii. ලෝකවිදූ නම් වේ. iv. සුගත නම් වේ

08. 'දානං සීලංච නෙක්ඛම්මං'.... යන ගාථාවෙන් දැක්වෙන්නේ,

i. දස සක්විති වත්ය. ii. දස පාරමිතාය.

iii. දස පුණ්‍ය ක්‍රියාවන් ය. iv. දස රාජධර්මයන්ය.

09. ගරු බුහුමන් වලදීද ,නින්දා අපහාස වලදීද , නොසැලී සිටීමෙන් ප්‍රකට වන්නේ බුදුරජාණන් වහන්සේ තුළ පැවති,

i. නිරහංකාර බවයි. ii. තාදී ගුණයයි.

iii. සමානාත්මතාවයි. iv. යතාවාදී තථාකාරී බවයි.

10. තණ්හාව මුල්කරගෙන සමාජයේ කල කෝලාහල ඇතිවන බව පටිච්ච සමුප්පාදයට අනුව පෙන්වා දී ඇත්තේ,

i. අග්ගිවච්ච ගොත්ත සූත්‍රයෙනි. ii. මහානිදාන සූත්‍රයෙනි.

iii. පත්තකම්ම සූත්‍රයෙනි. iv. චක්කවත්ති සිහනාද සූත්‍රයෙනි.

11. දෙවන ආත්මභාවයෙන් පසුව කවර හෝ ආත්මභාවයක දී විපාක දෙන කර්මය වන්නේ,

i. අපරාපරියවේදනීය කර්මයි. ii. ගරුක කර්මයි.

iii. කටත්තා කර්මයි. iv. උපපජ්ජවේදනීය කර්මයි.

12. මනා වූ පිළිවෙත් පුරන බැවින් මහා සංඝරත්නය,

i. උජුපටිපන්න නම් වේ. ii. සුපටිපන්න නම් වේ.

iii. සාමීචිපටිපන්න නම් වේ. iv. ඤායපටිපන්න නම් වේ.

13. පටිච්ච සමුප්පාදයේ සිතින් දැඩිව අල්ලා ගැනීමෙන් නැවත භවයට එකතු වන බව දැක්වෙන්නේ

i. වේදනා පච්චයා තණ්හා නමිනි. ii. උපාදාන පච්චයා භවො නමිනි.

iii. ඵස්ස පච්චයා වේදනා නමිනි. iv. සංඛාර පච්චයා විඤ්ඤාණ නමිනි.

14. සිත දමනය කර ගැනීම මාර බන්ධනයෙන් මිදීමට හේතුවන බව දැක්වෙන ධම්මපද ගාථාව වන්නේ,

i. කායේන සංවරෝ සාධූ... ii. සුකරානි අසාධූනී...

iii. දූරංගමං ඒකංචරං.... iv. අචරිත්වා බ්‍රහමචරියං...

15. කෝසල මල්ලිකා බිසව අවසන් මොහොතේ ඇතිකරගත් අකුසල් සිතිවිල්ලක් හේතුවෙන් දුගතිගාමී විය. එයට හේතු වූ කර්මය,

i. ආචිණ්ණ කම්ම නමින් හැඳින්වේ. ii. ආසන්න කම්ම නමින් හැඳින්වේ.

iii. ගරුක කම්ම නමින් හැඳින්වේ. iv. කටත්තා කම්ම නමින් හැඳින්වේ.

16. දිවා රෑ දෙකෙහිම භාවනාවට සිත යොමුකල බුද්ධ ශ්‍රාවකයෝ ප්‍රබුද්ධ ජීවිත ගත කරති. මෙහි ප්‍රබුද්ධ ජීවිතය ලෙස දක්වා ඇත්තේ

i. බුද්ධ ශ්‍රාවකයෙකු ලෙස සිටීමයි.

ii. සියලු කෙලෙස් යටපත් කර සිටීමයි.

iii. අලසකමින් උදාසීනකමින් තොරව ජීවත් වීමයි.

iv. දිවා රෑ පිංකම්වල නිරත වෙමින් ගත කරන ජීවිතයයි .

17. සිඟාලෝවාද සූත්‍රයට අනුව පැවිදි උතුමන් දක්වා ඇත්තේ,

i. දකුණු දිසාවටය. ii. නැගෙනහිර දිසාවටය.

iii. උඩ දිසාවටය. iv. උතුරු දිසාවටය.

18. පඨවි, ආපෝ, තේජෝ, වායෝ යනු,

i. සතරමහ භූත කොටස් ය. ii. සතර අගතිය ය.

iii. සතර කර්ම ක්ලේශයන් ය. iv. සතර ඍද්ධි පාදය ය.

19. තම අසල්වැසියාගේ සතුට දැක නිමල් ද සතුටට පත්විය. එය නිමල් තුළ පැවති,

i. මෛත්‍රී ගුණය නිසා ය. ii. මුදිතා ගුණය නිසා ය.

iii. කරුණා ගුණය නිසා ය. iv. උපේක්ෂා ගුණය නිසා ය.

20.

A පැළලුප් නුවර අශෝකාරාමය

B විශාලා මහනුවර වාලුකාරාමය

C සප්ත පර්ණී ගුහා ද්වාරය අභියස

D මාතලේ අලුවිහාරය

ථේරවාදී ධර්ම සංගායනා පැවැත් වූ ස්ථාන පෙළගැස්වූ විට

i. CABD නිවැරදිය. ii. ABCD නිවැරදිය.

iii. ACBD නිවැරදිය. iv. CBAD නිවැරදිය.

21. අරහං ගුණය තේමා කර ගනිමින් පූජාවලිය රචනා කළේ,

i. රණස්ගල්ලේ හිමියන්ය. ii. බුද්ධ පුත්‍ර හිමියන්ය.

iii. වීදාගම මෛත්‍රී හිමියන්ය. iv. ධර්මසේන හිමියන්ය.

22. පාසි සහිත ජලයට උපමාකර ඇත්තේ,

i. ව්‍යාපාදය යි. ii. ථීනමිද්ධය යි.

iii. විචිකිච්චාව යි. iv. උද්දච්ච කුක්කුච්ච යි.

23. සමථ භාවනාව සඳහා යොදා ගතහැකි කමටහන් ගණන,

i. 30 කි. ii. 40 කි.

iii. 50 කි. iv. 60 කි.

24. වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජ හිමියන්ගේ චරිතයෙන් අපට ගතහැකි ආදර්ශයකි.

i. වැඩිහිටියන්ට සැළකීම යි. ii. අධිෂ්ඨානශීලී බව යි.

iii. පොත් පත් රචනා කිරීම යි . iv. පිංපොතක් පවත්වාගෙන යාම යි.

25. බුදුරජාණන් වහන්සේ අටවන වස් කාලය ගතකළේ,

i. භේෂකලා පර්වතයේ ය . ii. මකුල පර්වතයේ ය.

iii. පාරිලෙය්‍ය වනයේ ය. iv. චාලිය පර්වතයේ ය.

26. ශ්‍රී ලංකාවේ පැරණිම සිංහල බෞද්ධ සාහිත්‍ය කෘතිය වන්නේ,

i. සීගිරි ගී ය. ii. සිඛවළඳ හා සිඛවළඳවිනිසයි.

iii. හෙළ අටුවා ය. iv. ධර්ම ප්‍රදීපිකාව ය.

27. යමක් කිරීමෙන් පසු නොතැවේ ද? එහි විපාකය සතුටින් විඳිය හැකිවේද? එබඳු ක්‍රියා සිදුකළ යුතුය. මේ බව දැක්වෙන ධම්මපද ගාථාව වන්නේ

i. අත්තනාව කතං කම්මං... ii. නතං කම්මං කතං සාධූ...

iii. සුකරානි අසාධූනි... iv. තංච කම්මං කතං සාධූ...

28. මම හෙවත් ආත්මය මුල්කොට ගෙන ඇතිවන ආශාව

i. කාම තණ්හා නම් වේ. ii. විභව තණ්හා නම් වේ.

iii. භව තණ්හා නම් වේ. iv. ත්‍රිවිධ තණ්හා නම් වේ.

29. බුදුරජාණන් වහන්සේ සාමඤ්ඤඵල සූත්‍රය දේශනා කළේ ,

i. ඉසිපතන මිගදායේ දී ය. ii. ජීවක අඹ වනයේ දී ය.

iii. ඉච්චානංගල වනයේ දී ය. iv. කලන්දක නිවාපයේ දී ය.

30. නිතර පන්සල් යන, ගුරුවරු ඇසුරු කරන, දැහැමින් ජීවත් වන **ජගත්** තුළ ඇත්තේ...

i. දැහැමි බවයි. ii. පින්වත් බවයි

iii. ශ්‍රද්ධාවන්ත බවයි. iv. ප්‍රඥාවන්ත බවයි.

31. බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති පිළිබඳව අසත්‍ය ප්‍රකාශයක් වන්නේ,

i. සතර සංග්‍රහ වස්තු අනුගමනය කළ යුතුය.

ii. සප්ත අපරිහානීය ධර්ම අනුගමනය කළ යුතුය.

iii. සතර අගති අනුගමනය කළ යුතුය.

iv. දස රාජධර්ම අනුගමනය කළ යුතුය.

32. පහත සඳහන් කරුණු අතරින් විදර්ශනා භාවනාවේ ආනිශංස වලට අයත් වන්නේ,

A. අටලෝ දහමට මැදිහත්ව මුහුණ දෙයි.

B. කායික මානසික පීඩා විඳ දරා ගනියි.

C. නිවන සාක්ෂාත් කළ හැකි වෙයි.

D. තිලකුණු පිළිබඳ අවබෝධයෙන් ජීවත් වෙයි.

E. පංචනීවරණ ධර්ම යටපත් කරයි.

i. ABCD ii. ABDE iii. ACDE iv. ABCE

33. මුනිගුණාලංකාරය කෘතිය රචනා කළේ,

i. වීදාගම මෛත්‍රීය හිමිය. ii. වැලිවිට සරණංකර හිමිය.

iii. රේරුකානේ චන්දවිමල හිමිය. iv. හික්කඩුවේ සුමංගල හිමිය.

34. 'සමග්ගා හෝථ මා විවදථ' යන්නෙහි අර්ථය වන්නේ

i. සමගියෙන් කරන විවාද යහපත් බවයි. ii. සමගිය විවාද නොකිරීමට හේතුවේ.

iii. සමගියෙන් විවාද කලයුතු බවයි . iv. සමගිවන්න, විවාද නොකරන්න යන්නයි.

35. දැනට හමුව ඇති කලාත්මක සඳකඩ පහණ ඇත්තේ,

i. අනුරාධපුරයේ බිසෝමාළිගාව අසලය. ii. අනුරාධපුරයේ රත්නප්‍රාසාදය අසලය.

iii. කුරුණෑගල නිල්ලක්ගමය. iv. පොළොන්නරු ගල් විහාරය අසලය

36. ලෝකයේ ඇති සියල්ල හේතුඵල සම්බන්ධය මත ක්‍රියාත්මක වන බව පෙන්වා දෙන්නේ,

i. චතුරාර්ය සත්‍යයෙනි. ii. පටිච්ච සමුප්පාදයෙනි.

iii. පුනර්භව සංකල්පයෙනි . iv. කර්ම හා විපාක සම්බන්ධයෙනි.

37. පරපණ නැසීම, සොරකම් නොකිරීම, වැරදි කාමසේවනයෙන් වැළකීම යන අකුසල් වලින් වැළකීම ආර්ය අෂ්ඨාංගික මාර්යේ දක්වා ඇත්තේ,

i. සම්මා සංකප්ප නමිනි. ii. සම්මා වායාම නමිනි.

iii. සම්මා ආජීව නමිනි. iv. සම්මා කම්මන්ත නමිනි.

38. නැගිට ගැනීමට බැරි තරමට ආහාර ගෙන, එහිම වැතිර සිටින පුද්ගලයා බුදුදහමෙහි හඳුන්වා ඇත්තේ,

i. කාකමාසක යනුවෙනි. ii. අලංසාටක යනුවෙනි.

iii. භුත්තවමිතක යනුවෙනි. iv. තත්ථාවට්ටක යනුවෙනි.

39. විනීතා දුප්පත් පවුලක උපත ලැබුවත් උසස් රූපශෝභාව නිසා වාසනාවන්ත ජීවිතයක් ගතකරයි... එසේවීමට හේතු වූයේ,

i. කාල සම්පත්තිය නිසාය. ii. උපධි සම්පත්තිය නිසාය .

iii. ප්‍රයෝග සම්පත්තිය නිසාය. iv. ජනක කර්ම නිසාය.

40. දෙවන ධර්ම සංගායනාව සඳහා රාජ්‍ය අනුග්‍රහය ලබා දුන්නේ

i. අජාසත්ත රජුය. ii. අශෝක රජුය.

iii. කාලාශෝක රජුය. iv. කණිෂ්ක රජුය.

# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Sabaragamuwa Provincial Department of Educition

අනාවරණ පරීක්ෂණය - 2021
Diaganostic Test

බුද්ධ ධර්මය II
Buddhism II

- **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20ක් ද, 2 සිට 6 දක්වා ප්‍රශ්න සඳහා ලකුණු 2, ලකුණු 3, ලකුණු 5 බැගින් පිරිනැමේ.
- හත්වන ප්‍රශ්නයට එක් කොටසකට ලකුණු 5 බැගින් උපරිම ලකුණු 10කි.

---

(01) i. සතර බ්‍රහ්ම විවරණ නම් කරන්න.
ii. බෞද්ධ භාවනාවේ ප්‍රධාන ප්‍රභේද දෙක නම් කරන්න.
iii. ශ්‍රද්ධාවේ කොටස් දෙක ලියා දක්වන්න.
iv. ජිගච්ඡා පරමා රෝගා... යන්නෙහි අදහස ලියන්න.
v. වචනයෙන් සිදුවන අකුසල් හතර ලියන්න.
vi. සිගාලෝවාද සූත්‍රයේ දෙමාපියන් හා ගුරුවරු දක්වා ඇති දිසා පිළිවෙලින් ලියන්න.
vii දෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල දෙකක් ලියන්න
viii සත්වයාට පෙර කරන ලද කර්මවලට විපාක විඳවීමට සිදුවන බව දැක්වෙන සූත්‍රය කුමක් ද?
ix "මාගේ මේ ව්‍යායාමය බුදු සසුනේ චිරස්ථිතිය පිණිස මිස කිසි කලෙකත් රජ සැප පිණිස නොවන්නේය..." මෙය කාගේ ප්‍රකාශයක් ද?
x "චේතනාහං භික්ඛවේ කම්මං වදාමි... චේතයිත්වා කම්මං කරෝති කායේන වාචාය මනසා..." යන්නෙහි අර්ථය ලියන්න. (2x10) 20)

(02) i. අත්තනාව කතං පාපං ... ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 02)
ii. එහි තේරුම ලියන්න. (ලකුණු 03)
iii. පුද්ගල ජීවිතය සාර්ථක කර ගැනීමට ධම්ම පදයෙන් කදිම උපදෙස් ලබාදෙයි. පැහැදිලි කරන්න. (ලකුණු 05)

(03) i. පාරමිතා යන්න පැහැදිලි කරන්න. (ලකුණු 02)
ii. පාරමිතාවක් කොටස් 03 කට බෙදේ. ඒවා මොනවාද? (ලකුණු 03)
iii. ශිෂ්‍ය ජීවිතය සාර්ථක කර ගැනීමට පාරමිතා මග පෙන්වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 05)

(04) i. කර්මය යනු කුමන්ද?. (ලකුණු 02)
ii. විපාක දෙන ආකාරය අනුව කර්මයේ ප්‍රභේද නම් කරන්න ? (ලකුණු 03)
iii. අකුසල් නොකර කුසල් ක්‍රියාවල නිරත වීමෙන් දෙලොව ජීවිතය සාර්ථක කරගත හැක. පැහැදිලි කරන්න. (ලකුණු 05)

(05) i. ස්තූප ආකෘති දෙකක් ලියන්න. (ලකුණු 02)
ii. ස්තූපයක අංග තුනක් නම් කරන්න (ලකුණු 03)
iii. 'පූජනීය ස්ථාන ආරක්ෂා කිරීම අප සැමගේ වගකීමයි.' පැහැදිලි කරන්න. (ලකුණු 05)

(06) i. පළමුවන ධර්ම සංගායනාව පැවැත්වීමට තුඩුදුන් හේතු සැකෙවින් දක්වන්න. (ලකුණු 02)

ii. එම ධර්ම සංගායනාව පැවැත්වූ ස්ථානය, අනුග්‍රහය ලබාදුන් පාලකයා, සහභාගි වූ භික්ෂූන් වහන්සේලා ගණන පිළිවෙලින් ලියන්න (ලකුණු 03)

iii. පළමුවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල ගෙනහැර දක්වන්න. (ලකුණු 05)

(07) පහත සඳහන් මාතෘකා අතුරින් දෙකකට කෙටි සටහන් ලියන්න.

i. පුරිසධම්ම සාරථී ගුණය

ii. පරිසරය සුරකිමු

iii. පංචනීවරණ ධර්ම

v. පංචසීල ප්‍රතිපදාව

(2x5 =10)

# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Sabaragamuwa Provincial Department of Education

අනාවරණ පරීක්ෂණය - 2021 | 11 ශ්‍රේණිය
Diaganostic Test | Grade 11

බුද්ධ ධර්මය I,II
Buddhism I.II

පිළිතුරු පත්‍රය
Answer Sheet

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|
| 1 | 2 | 21 | 2 |
| 2 | 4 | 22 | 2 |
| 3 | 2 | 23 | 2 |
| 4 | 3 | 24 | 2 |
| 5 | 2 | 25 | 1 |
| 6 | 4 | 26 | 3 |
| 7 | 2 | 27 | 4 |
| 8 | 2 | 28 | 1 |
| 9 | 2 | 29 | 2 |
| 10 | 2 | 30 | 1 |
| 11 | 1 | 31 | 3 |
| 12 | 2 | 32 | 1 |
| 13 | 2 | 33 | 1 |
| 14 | 3 | 34 | 4 |
| 15 | 2 | 35 | 1 |
| 16 | 3 | 36 | 2 |
| 17 | 3 | 37 | 4 |
| 18 | 1 | 38 | 4 |
| 19 | 2 | 39 | 2 |
| 20 | 4 | 40 | 3 |

(01) i. මෙත්තා, මුදිතා, කරුණා, උපේක්ඛා

ii. සමථ භාවනාව හා විපස්සනා භාවනාව

iii. අමූලිකා ශ්‍රද්ධාව /ආකාරවතී ශ්‍රද්ධාව

iv. කුසගින්න ලොව පවත්නා බලවත්ම රෝගයයි.

v. බොරු කීම /කේලාම් කීම /පරුෂ වචන කීම / හිස් වචන කීම

vi දෙමාපියන් - නැගෙනහිර /ගුරුවරු - දකුණු දිසාව

vii. දස අකැප වස්තුව ප්‍රතික්ෂේප කිරීම
අටලොස් නිකාය බිහිවීම

viii. චූල්ලකම්ම විභංග සූත්‍රය

ix. දුටුගැමුණු රජතුමා

x. "මහණෙනි මම චේතනාව කර්මය යැයි කියමි සිතින් සිතා කයෙන් වචනයෙන් මනසින් කර්ම සිදු කරයි.

(02) i. අත්තනාව කතං පාපං
අත්තනා සංකිලිස්සති
අත්තනා අකතං පාපං
අත්තනාව විසුජ්ඣති
සුද්ධි අසුද්ධි පච්චත්තං
නාඤ්ඤෝ අඤ්ඤං විසෝධයේ

ii. යමෙකු පව් කලොත් එයින් ඔහුම කෙලෙසෙන්නේය.
යමෙකු පව් නොකලොත් එයින් ඔහුම පිරිසිදු වන්නේය.
පිරිසිදුකම හා අපිරිසිදුකම පවතින්නේ තමා කෙරෙහිමය.
එක් අයෙකුට තවත් අයෙකු පිරිසිදු කළ නොහැකිය.

iii. පිළිතුර බලා ප්‍රමාණවත් ලකුණු දෙන්න.

(03) i. බුද්ධත්වය ප්‍රාර්ථනා කරන බෝසත් උතුමන් විසින් පුරනු ලබන උතුම් පිළිවෙත් යන අර්ථයෙන් පාරමිතා යන්න පැහැදිලි කළ හැක.

ii. පාරමිතා, උපපාරමිතා, පරමත්ත පාරමිතා

iii. 11 ශ්‍රේණිය 3 වන පාඩම (18 පිටුව)
සමස්තය බලා ලකුණු දෙන්න

(04) i. 10 ශ්‍රේණිය 12 වන පාඩම (67 පිටුව)

ii. ගරුක කර්මය, ආසන්න කර්මය, ආචින්න කර්මය, කටත්තා කර්මය

iii. පිළිතුර බලා ප්‍රමාණවත් ලකුණක් දෙන්න

(05) i. ඝණ්ටාකාර, ඝටාකාර, බුබ්බුලාකාර, ධාන්‍යාකාර, පද්මාකාර, ආම්ලාකාර
10 ශ්‍රේණිය 20 (109 පිටුව)

ii. 10 ශ්‍රේණිය 20 පාඩම (110 පිටුව)

iii. 10 ශ්‍රේණිය 20 පාඩම (116 පිටුව)

(06) i. 11 ශ්‍රේණිය 16 පාඩම (109 පිටුව)

ii. 11 ශ්‍රේණිය 16 පාඩම (109, 110 පිටුව)

iii. 11 ශ්‍රේණිය 16 පාඩම (111, 112 පිටුව)

(07) i. 11 ශ්‍රේණිය 2 පාඩම (11, 12, 13 පිටුව)

ii. 10 ශ්‍රේණිය 16 පාඩම (88 පිටුව /11 ශ්‍රේණිය 14 පාඩම (98, 99 100, 101 පිටුව)

iii. 11 ශ්‍රේණිය 4 පාඩම (34, 35 36, 37 පිටුව)

iv. 11 ශ්‍රේණිය 7 පාඩම (57 පිටුව)